# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## සුසන්ත පුංචිනිලමෙ පදනම (සංස්ථාගත කිරීමේ)

**සුසන්ත පුංචිනිලමෙ පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

---

කළුතර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ලක්ෂ්මන් ආනන්ද විජේමාන්න මහතා විසින් 2015 දෙසැම්බර් මස 01 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2015 නොවැම්බර් මස 16 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

---

[27 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

**මිළ : රු. 8.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 10.00 යි.**

2—PL 009481—225 (2015/12)

## සුසන්ත පුංචිනිලමෙ පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

*පූර්විකාව.*

''සුසන්ත පුංචිනිලමෙ පදනම'' යනුවෙන් සඳහන් කරනු ලබන පදනමක් එකී පදනමේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව ඒ පදනමේ පරමාර්ථ හා ඊට අදාළ කාරණා එලදායී ලෙස ක්‍රියාවේ යෙදවීමේ කාර්යය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, ත්‍රිකුණාමලය නගරයේ, පේදුරු කොටුව, මාගෝසා ටෙරස් දරන ස්ථානයේ පිහිටුවා තිබූ හෙයින් ද:

එකී පදනම පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කරුණු සඳහා ද, ඒ පරමාර්ථ සහ කරුණු මෙතක් කල් එකී පදනම විසින් සාර්ථකව ක්‍රියාත්මක කර සහ ඉටුකර ඇති හෙයින් ද සහ එකී පදනම සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති හෙයින් ද එකී ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

*ලුහුඬු නාමය.*

1. මේ පනත 2015 අංක     දරන සුසන්ත පුංචිනිලමෙ පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

*සුසන්ත පුංචිනිලමෙ පදනම සංස්ථාගත කිරීම.*

2. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන්පසු (මෙහි මින් මතු ''පදනම'' යනුවෙන් සඳහන් කරනු ලබන) සුසන්ත පුංචිනිලමෙ පදනමේ දැනට සාමාජිකයන්ව සිටිනතාක් තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු බඳවා ගනු ලබන තැනැත්තන් (මෙහි මින්මතු ''සංස්ථාව'' යනුවෙන් හඳුන්වනු ලබන) ''සුසන්ත පුංචිනිලමෙ පදනම'' යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු ය. තව ද, ඒ නාමයෙන් ඒ සංස්ථාව විසින් ද, එයට විරුද්ධව ද, සියලු අධිකරණවල දී නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ, එය පාවිච්චි කිරීමේ, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය හා අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය.

*සංස්ථාවේ පොදු පරමාර්ථ.*

3. සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ කවර පරමාර්ථ සඳහා ද, ඒ පොදු පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) කාන්තාවන්ගේ හා ළමුන්ගේ සියලුම අයිතීන් ප්‍රවර්ධනය කිරීම හා වැඩිදියුණු කිරීම සඳහා ක්‍රියා කිරීම;

2—PL 009340—300 (2015/10)

(ආ) හදිසි ආපදාවල වින්දිතයන්ට සහාය දීම හා ඔවුන්ට තම ජීවන තත්ත්වය නගා සිටුවා ගැනීම සඳහා ආධාර ලබා දීම හා දිළිඳු තැනැත්තන්ට අවශ්‍ය අවස්ථාවන්හි නීති ආධාර හා නීති උපදෙස් ලබාදීම;

(ඇ) ජනතාවගේ සදාචාරාත්මක හා සංස්කෘතික අගයන් සුරැකීමට හා ආරක්ෂා කිරීමට පියවර ගැනීම;

(ඈ) ආගමික මධ්‍යස්ථාන සංවර්ධනය කිරීමේ ලා ආධාර හා උපදෙස් ලබා දීම;

(ඉ) රට තුළ ජීවත්වන සියලුම ජාතීන්ට සමගියෙන් හා සහජීවනයෙන් ජීවත්වීමට අවශ්‍ය සියලු උපදෙස් හා ආධාර ලබා දීම;

(ඊ) යුද්ධය ඇතුළු විවිධ හේතූන් මත වැන්දඹුභාවයට පත්වූ කාන්තාවන්ගේ හා ඔවුන්ගේ දූ දරුවන්ගේ සුබසාධනය මෙන්ම ආර්ථික ප්‍රවර්ධනය සඳහා අවශ්‍ය මූල්‍යමය ඇතුළු අනෙකුත් සියලු අංශවල සහයෝගය හා ආධාර ලබා දීම;

(උ) කලා ක්ෂේත්‍රයේ විවිධ දක්ෂතාවන් ඇති අයවලුන්ට එම කටයුතු ප්‍රවර්ධනයට සහ එළිදැක්වීමට, ප්‍රසංග පැවැත්වීමට, උපාංග ලබා ගැනීමට මෙන්ම ඒ සඳහා වූ සියලු අංශ වෙනුවෙන් සහාය ලබා දීම;

(ඌ) පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට සිය අධ්‍යාපන කටයුතු ඵලදායි ලෙස ඉටුකර ගැනීමට පහසුවන පරිදි පාසල්වලට භෞතික හා ගුණාත්මක වශයෙන් ආධාර හා අනුබල ලබා ගැනීම;

(එ) සාරධර්ම හා ආචාරධර්ම අගයන ප්‍රායෝගිකව ක්‍රියාවට නංවන සිසු පරපුරක් නිර්මාණය කර ගැනීමට හැකිවන පරිදි විශේෂිත වූ පුහුණු වැඩසටහන් ක්‍රියාවට නැංවීම;

(ඒ) ජ්‍යෙෂ්ඨ පුරවැසි සංවිධාන විසින් ඉටුකරනු ලබන සේවා පහසුකම් සඳහා ආධාර කිරීම හා එම සංවිධාන දිරි ගැන්වීම;

(ඔ) විරැකියාවෙන් පෙළෙන තරුණ ප්‍රජාව ස්වයං රැකියාවලට යොමු කිරීමට අවශ්‍ය ආධාර හා අනුබලය ද, පුහුණුව ද ලබා දීමට කටයුතු කිරීම;

(ඕ) ඉහත දැක්වෙන පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති දේශීය හා විදේශීය සංවිධාන සමඟ සහයෝගීව කටයුතු කිරීම.

**සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.**

4. (1)පදනමේ කටයුතු මේ පනතේ අනිකුත් විධිවිධාන සහ සංස්ථාවේ තත්කාලයේ පවත්නා රීතිවලට යටත්ව සහ එම රීතිවලට අනුකූලව තෝරා පත්කර ගනු ලබන සභාපති, ලේකම්, භාණ්ඩාගාරික ඇතුළු 11 දෙනකුගෙන් සමන්විත අධ්‍යක්ෂ මණ්ඩලයක් මගින් කළමනාකරණය කරනු ලැබිය යුතු ය.

(2) පදනමේ ආරම්භක සාමාජිකයා වූ ගරු සුසන්ත පුංචිනිලමෙ මහතා අධ්‍යක්ෂ මණ්ඩලයේ යාවජීව සභාපතිවරයා විය යුතු අතර, ඉන් අනතුරුව එවකට සභාපතිවරයා ලෙස ධුරය දරන තැනැත්තාගේ පවුලේ සාමාජිකයකු අධ්‍යක්ෂ මණ්ඩලයේ ඊළග සභාපතිවරයා විය යුතු ය.

(3) සංස්ථාවේ ප්‍රථම අධ්‍යක්ෂ මණ්ඩලය මේ පනත ක්‍රියාත්මක වන දිනට පෙරාතුව ම වූ දිනයේ දී පදනමේ පාලක මණ්ඩලයේ සාමාජිකත්වය දැරුවා වූ පුද්ගලයන්ගෙන් සමන්විත විය යුතු ය.

(4) සභාපතිවරයා හැර අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයකු මිය යෑම හෝ ඉල්ලා අස්වීම නිසා කලින් ධුරය අත්හළහොත් මිස, අවුරුදු හතරක කාලයක් සඳහා ධුරය දැරිය යුතු ය. මිය යෑම හෝ ඉල්ලා අස්වීම නිසා අධ්‍යක්ෂ මණ්ඩලයේ පුරප්පාඩුවක් ඇතිවන අවස්ථාවක දී එම පුරප්පාඩුව පිරවීම සඳහා නව සාමාජිකයකු පත්කළයුතු අතර, එම නව සාමාජිකයා අවුරුදු හතරක් ධුරය දැරිය යුතු ය.

**සංස්ථාවේ සාමාන්‍ය බලතල.**

5. බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වාගෙන යාමේ හා වැසීමේ ද ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමේ හෝ ලබා ගැනීමේ ද, ප්‍රදානයන් හා පරිත්‍යාග භාර ගැනීමේ සහ එකතු කිරීමේ ද, සංස්ථාවේ මුදල් ආයෝජනය කිරීමේ ද, සංස්ථාවේ පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් සේවයට බඳවා ගැනීමේ, සේවය නියුක්ත කිරීමේ, සේවයෙන් පහ කිරීමේ ද බලය ඇතුළුව, සංස්ථාවේ සියලුම පරමාර්ථ හෝ එහි යම් පරමාර්ථයක් ප්‍රවර්ධනය කිරීම හෝ සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය සියලු ක්‍රියා, කරුණු හෝ දේවල් කිරීමේ, ඉටු කිරීමේ සහ ක්‍රියාවේ යෙදවීමේ බලය මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව සංස්ථාවට ඇත්තේ ය.

**6.** (1) සංස්ථාව විසින් කලින් කල යම් මහා සභා රැස්වීමකදී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන්, පහත දැක්වෙන සියලු කාරණා හෝ ඉන් කිසිවක් සඳහා මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති සෑදීම නීත්‍යානුකූල වන්නේ ය:— සංස්ථාවේ රීති.

(අ) සාමාජිකයන් වර්ග කිරීම, සාමාජිකයන් විසින් ගෙවිය යුතු සාමාජික ගාස්තු, ඔවුන් ඇතුළත් කර ගැනීම, අස් කිරීම, නෙරපීම හෝ ඉල්ලා අස්වීම;

(ආ) සංස්ථාවේ හා අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීම් කැඳවීම හා පැවැත්වීම සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු කාර්යය පටිපාටිය, එකී රැස්වීම්වල ගණපූරණය ද, ඔවුන්ගේ බලතල හා කාර්යයන් ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම;

(ඇ) සංස්ථාවේ විවිධ නිලධරයන්, අනුයෝජිතයන් සහ සේවකයන් පත් කිරීම, ඔවුන්ගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය;

(ඈ) සංස්ථාවේ සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයකු වීම සඳහා අවශ්‍ය කරන සුදුසුකම්; සහ

(ඉ) සංස්ථාවේ දේපළ පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම.

(2) සංස්ථාව විසින් සාදනු ලැබූ යම් කිසි රීතියක් (1) වන උපවගන්තිය යටතේ රීතියක් සාදනු ලැබූ ආකාරයෙන් ම සහ එවැනිම රැස්වීමක දී සංශෝධනය කිරීම, වෙනස් කිරීම හෝ ඒවාට යමක් එකතු කිරීම හෝ ඒවා පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැක්කේ ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

**7.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී පැවති පදනමේ සියලු ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, එදිනට පදනමට අයවිය යුතු සියලු ණය සහ ගෙවිය යුතු සම්මාදම් මුදල් හෝ දායක මුදල් මේ පනතේ කාර්යය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය. සංස්ථාව විසින් ගෙවිය යුතු සහ සංස්ථාවට අයවිය යුතු ණය.

**8.** (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු අතර, සංස්ථාව සඳහා සහ වෙනුවෙන් මෙතෙක් භාර ගන්නා ලද හෝ මින්මතු භාරගනු ලබන ත්‍යාග, රික්තවරණ, පරිත්‍යාග, දායක මුදල්, ගාස්තු හෝ ප්‍රධාන වශයෙන් වූ මුදල් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි සංස්ථාවේ නමින් එක බැංකුවක හෝ බැංකු කීපයක තැන්පත් කළ යුතු ය. සංස්ථාවේ අරමුදල.

(2) මෙම පනත යටතේ සංස්ථාවේ බලතල ක්‍රියාත්මක කිරීමේ දී සහ ඉටුකිරීමේ දී හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී සංස්ථාව විසින් දරනු ලබන වියදම් පියවීමට අවශ්‍ය සියලු මුදල්, සංස්ථාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

**9.** යම් මිළට ගැනීමක්, ප්‍රදානයක්, බද්දට ගැනීමක්, තෑගි ලැබීමක්, කිසියම් ගිවිසුමක් මත හෝ අන්තිම කැමති පත්‍රයකින් දේපළ බැහැර කිරීමක් ප්‍රකාර හෝ වෙනත් ආකාරයකින් සංස්ථාව සතු වන්නා වූ චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීමට හා දැරීම නීතියෙහි ලා සංස්ථාවට බලය හා හැකියාව ඇති අතර, එම දේපළ සංස්ථාවේ කාර්යය සඳහා සංස්ථාව විසින් දැරිය යුතු ය. තව ද සංස්ථාවේ තත් කාලයේ බලපවත්නා රීතිවලට යටත්ව දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය සංස්ථාවට ඇත්තේ ය. සංස්ථාව විසින් චංචල හෝ නිශ්චල දේපළ දැරිය හැකි බව.

**10.** සංස්ථාවේ කිසිම සාමාජිකයකු සංස්ථාවේ ණය සහ බැරකම් ගෙවා සමථයට පත් කිරීමේ කාර්යය සඳහා හෝ වෙනත් යම් කාර්යයක් සඳහා හෝ ඔහුගෙන් සංස්ථාවට අයවිය යුතු සාමාජික මුදල් ප්‍රමාණය ඉක්මවන යම් දායක මුදලක් ගෙවීමට යටත් නොවන්නේ ය. සාමාජිකයන්ගේ වගකීම සීමා කිරීම.

**11.** සංස්ථාව විසුරුවා හැරීමේ දී, එහි සියලු ණය සහ බැරකම් පියවීමෙන් පසුව කවර හෝ දේපළක් ඉතිරි වුවහොත්, ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර නොබෙදිය යුතු අතර, ඒවා සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති සහ ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපළක් ස්වකීය සාමාජිකයන් අතර බෙදීම තහනම් කර ඇත්තා වූ ද, වෙනත් යම් ආයතනයකට හෝ ආයතනවලට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය. සංස්ථාව විසුරුවා හරිනු ලබන අවස්ථාවේ දී හෝ ඊට පෙරාතුවම, සංස්ථාවේ සාමාජිකයන් විසින් එම ආයතනය හෝ ආයතන තීරණය කරනු ලැබිය යුතු ය. විසුරුවා හැරීමේ දී ඉතිරිවන දේපළ.

ගිණුම් සහ විගණනය.

**12.** (1) සංස්ථාවට ලැබුණු සහ සංස්ථාව විසින් වැය කරන ලද සංස්ථාවේ සියලු මුදල් පිළිබඳව ගිණුම් නිසි අයුරින් තැබීමට සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සැලැස්විය යුතු ය.

(2) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(3) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරන ලද විගණකවරයකු හෝ විගණකවරයන් විසින් සෑම වර්ෂයකදීම යටත් පිරිසෙයින් එක් වරක් ගිණුම් පරීක්ෂාකොට විගණනය කරගත යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව.

**13.** සංස්ථාවේ සභාපතිවරයා සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ එක් සාමාජිකයකු ඉදිරිපිට දී මිස සංස්ථාවේ මුද්‍රාව කිසිදු සාධන පත්‍රයකට නොතැබිය යුතු ය. තමන් පැමිණ සිටි බවට සළකුණක් වශයෙන් ඔවුන් විසින් එකී සාධන පත්‍රයේ තම නම ලියා අත්සන් කළ යුතු අතර, ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් අත්සන් කිරීමට පරිබාහිරව විය යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**14.** ශ්‍රී ලංකා ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**15.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.